# ධර්ම ශාස්ත්‍ර වීමංසා

# DHARMA ŚĀSTRA VĪMAṀSĀ

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමි අභිස්තුති ශාස්ත්‍රීය ලේඛන සමුච්චය

FESTSCHRIFT FOR THE
VENERABLE DR. BODAGAMA CHANDIMA THERA

දෙවන වෙළුම | Vol. II



**සංස්කරණය**
පස්ගොඩ සුමිත්ත හිමි
සූරියවැව සුමේධ හිමි
ගුරුගොඩ සිරිවිමල හිමි

**Editors**
Ven. Pasgoda Sumiththa
Ven. Sooriyawewa Sumedha
Ven. Gurugoda Siriwimala

# ධර්ම ශාස්ත්‍ර වීමංසා
# DHARMA ŚĀSTRA VĪMANSĀ

**ආචාර්ය බෝදාගම චන්දිම නාහිමි අභිස්තුති ශාස්ත්‍රීය**
**ලේඛන සමුච්චය**

**FESTSCHRIFT FOR THE**
**VENERABLE DR. BODAGAMA CHANDIMA THERA**

**දෙවන වෙළුම | Vol. II**

නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය
මානෙල්වත්ත.
Nāgānanda International Institute for Buddhist Studies,
Manelwatta.

# ධර්ම ශාස්ත්‍ර විමංසා
# DHARMA ŚĀSTRA VĪMANSĀ

**ආචාර්ය බෝදාගම චන්දිම නාහිමි අභිස්තුති ශාස්ත්‍රීය ලේඛන සමුච්චය**

**FESTSCHRIFT FOR THE VENERABLE DR. BODAGAMA CHANDIMA THERA**

**දෙවන වෙළුම | Vol. II**

**උපදේශකත්වය**

ආචාර්ය දම්පේ විජිතරතන හිමි
ආචාර්ය හේනේගම ධම්මරතන හිමි
මහාචාර්ය අසංග තිලකරත්න
මහාචාර්ය ප්‍රශාන්ත බී. මණ්ඩාවල
ආචාර්ය ඩබ්. ඩී. සජීව පේමසිංහ

**සංස්කරණය**

පස්ගොඩ සුමිත්ත හිමි
සූරියවැව සුමේධ හිමි
ගුරුගොඩ සිරිවිමල හිමි

**ප්‍රකාශනය**

නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය

මානෙල්වත්ත.
Nāgānanda International Institute for Buddhist Studies,
Manelwatta.

මෙහි අන්තර්ගත සියලු ම ශාස්ත්‍රීය ලිපිවල ඇතුළත් අදහස් ඒ ඒ ලේඛකයන් සතු වන බැවින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සැළකුව මනා ය. එමෙන්ම මෙහි අක්ෂර වින්‍යාසය, ලකුණු, පද බෙදීම් හා වාක්‍ය වින්‍යාසය ආදිය ද ඒ ඒ ලේඛකයන්ගේ අභිමත ලේඛන ශෛලිය හා රීතිය මත සිදු වී ඇති බව ද සැළකුව මනා ය.

# ධර්ම ශාස්ත්‍ර විමංසා

# DHARMA ŚĀSTRA VĪMANSĀ

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමි අභිස්තුති ශාස්ත්‍රීය ලේඛන සමුච්චය

## FESTSCHRIFT FOR THE VENERABLE DR. BODAGAMA CHANDIMA THERA

**දෙවන වෙළුම | Vol. II**

---

**Edited & Compiled by**

Ven. Pasgoda Sumitta Thero

Ven. Sooriyawewa Sumedha Thero

Ven. Gurugoda Siriwimala Thero

---

**©Publisher**

Nāgānanda International Institute for Buddhist Studies,

Manelwatta, Bollegala, Kelaniya, Sri Lanka.

---

**ISBN :** 9 786246 019051

---

**Page Layout Edited by:**

Sandini Rasanjali

---

**Cover Designed by:**

Buddhi Rangana

---

**Printed by:**

K.S.U. Graphic (PVT) Ltd.

No. 510, Rajagiriya Road, Rajagiriya.

Tel: 011 2884701




**Vice Chancellor**

**Nāgānanda International Institute for Buddhist Studies**

**VENERABLE DR. BODAGAMA CHANDIMA THERA**

# අස්ගිරි මහා විහාරය - මහනුවර

**Asgiri Maha Viharaya | Kandy | Sri Lanka.**
**(Main Monastery of Asgiriya Chapter)**

(1312 AD)

Most Venerable Dr.Warakagoda Gnanarathana
Mahanayake Thero.
Official Residence,
Asgiri Maha Viharaya, Kandy, Sri Lanka.

මහනුවර හයගිරි (අස්ගිරි) විජයසුන්දරාරාම විහාරද්වයාධිපති
ආචාර්ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන
මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ
මහානායක ස්ථවිරයන් වහන්සේ

| දුරකථන අංකය Telephone No. | +94 812 229 600 | විද්‍යුත් තැපෑල E - mail | asgirimahimi22@gmail.com | ෆැක්ස් අංකය Fax No. | +94 812 229 600 |
| --- | --- | --- | --- | --- | --- |


මහනුවර ශ්‍රී හයගිරි විජයසුන්දරාරාම විහාරද්වයාධිපති,ඓතිහාසික බදුලු මුතියංගණ රාජමහා විහාරාධිපති අතිපූජ්‍ය ආචාර්ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ අතිගරු මහානායක මාහිමිපාණන් වහන්සේගේ සුභාශිංසන පණිවුඩය

දැන-උගත් විචිත්‍රභාණක තෙර නමක් වශයෙන් ජාත්‍යන්තරයේ පවා ප්‍රචලිත මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයේ නිර්මාතෘ වූ එහි උපකුලපති බෝදාගම චන්දිම නායක ස්ථවිරයන්ගේ 69 වන ජන්ම දිනය නිමිති කොට ගෙන පිංකම් මාලාවක් පැවැත්වෙන බව දැන ගැනීමට ලැබීම අප කාගේත් සතුටට කාරණයකි. ඊට සමගාමීව පසු ගිය කාලවකවානුව තුල අප රට තුළ ඇති වූ ස්වභාවික ආපදා තත්ත්වයෙන් පීඩාවට පත්වූ ජනතාව සඳහා මූල්‍යාධාර පිරිනැමීම ද ඉතාමත් යහපත් කාලෝචිත ක්‍රියාවකි.

බෝදාගම චන්දිම නායක ස්ථවිරයන් අප රටතුළ මෙන්ම දේශ දේශාන්තරයන්හි ථෙරවාදී බුදු දහම් ප්‍රචලිත කිරීමට අතිවිශාල මෙහෙවරක් ඉටු කර ඇත. ඒ අතරින් අපේ දේශීය මෙන්ම විදේශීය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපනය සඳහා මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය නිර්මාණය කිරීමම අපේ රට තුළ බෞද්ධ අධ්‍යාපන උන්නතිය සඳහා ඉටු කරනු ලැබූ මහගු සේවාවක් ලෙස සැලකිය හැකිය. එපමණක් නොව උන්වහන්සේගේ ධර්ම ප්‍රචාරක කටයුතු ලෙස පිරුවානා පොත් වහන්සේ ඇතුළුව නොයෙක් ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ සහ ත්‍රිපිටක ග්‍රන්ථයන් දහස් ගණනක් මුද්‍රණය කොට නොමිලයේ බෙදා දී ඇත. උන්වහන්සේ වැනි විරප්‍රසිද්ධ යතිවරයන් වහන්සේලා විසින් කරන්නාවූ ශාසනික සහ සමාජ සේවාවන් ඇගැයීමට ලක් කිරීම සඳහා මෙදිනම, තායිලන්තයේ මහාචූලාලොන්කෝන් රාජවිද්‍යාල විශ්ව විද්‍යාලය තුළින් උන්වහන්සේට 'සාහිත්‍යශූරි' ගෞරව උපාධියක් පිරිනැමීම සම්බන්ධයෙන් අපගේ ප්‍රශංසාව පළ කර සිටිමු.

මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයේ නිර්මාතෘ වූ එහි උපකුලපති බෝදාගම චන්දිම නායක ස්ථවිරයන් වහන්සේට තවත් චිරාත් කාලයක් ලෝ සසුන් වැඩ වඩන්නට රත්නත්‍රයානුභාවයෙන් හා දළදා සමිඳු පිහිටෙන් ශක්තිය ධෛර්යය හා චිර ජීවනය සැලසේවායි ආශිංසනය කරම්හ.

ඒ වගත් මෙසේම,

වරකාගොඩ ශ්‍රී ඥානරතන

මහනුවර ශ්‍රී හයගිරි විජයසුන්දරාරාම විහාරද්වයාධිපති,
ඓතිහාසික බදුලු මුතියංගණ රාජමහා විහාරාධිපති
ආචාර්ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන
මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
මහානායක ස්ථවිරයන් වහන්සේ වම්හ.

ආපදානසොභිනී පසැදහා

**ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ**

**උත්තරීතර මහානායක**

ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ රාස්සගල පාර්ශවයේ මහානායක
විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අංශයේ හිටපු කථිකාචාර්ය
පර්යාප්ති ශාසනධ්වජාග්‍ර ප්‍රවචන කීර්ති ශ්‍රී සද්ධර්මාචාර්ය
ආනන්ද මෛත්‍රෙය වංශාවතංශ

# කරගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති මහානායක ස්ථවිර

ශ්‍රී ලංකා අමරපුර මහාසංඝ සභාව,
ශ්‍රී ලංකා අමරපුර මහාසංඝ සභා කාර්යාලය,
අංක 70, ගාලු පාර,
වැල්ලවත්ත,
කොළඹ 06

ශ්‍රී ධර්මානන්ද විද්‍යායතන පිරිවෙන,
මීරිස්වත්ත, බලංගොඩ
+ 94 45 228 7112
+ 94 71 987 0697
piriwena1946@gmail.com

මානෙල්වත්ත, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයේ නිර්මාතෘ, එහි උපකුලපති බෝදාගම චන්දිම නායක හිමිපාණන්ගේ 69 වන ජන්ම දිනය නිමිත්තකොට පිංකම් මාලාවක් පැවැත්වෙන බව දැන ගැනීමට ලැබීම ඔබ අප සැම දෙනාගේම සතුටට කරුණක් වනු ඇත.

බෝදාගම චන්දිම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ දේශීය මෙන්ම ජාත්‍යන්තරවද ථෙරවාදී බුදුදහම ප්‍රචලිත කිරීම සඳහා මේ වන විට මහඟු මෙහෙයක් ඉටුකර ඇත. දේශීය මෙන්ම විදේශීය භික්ෂූන් වහන්සේලාට ධර්ම ඥානය ප්‍රවර්ධනය සඳහා මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලය ආරම්භකර අපරට තුළින් මේ රටට පමණක් නොව මුළු ලෝකයට ම එම දහම් පණිවිඩය ලබා දීම සඳහා ඉටු කරන මෙහෙය ප්‍රශංසනීය ය.

ත්‍රිපිටක ග්‍රන්ථත්, පිරුවානාපොත් වහන්සේත් මුද්‍රණයකර නොමිලේ බෙදාදීමේ ක්‍රියාදාමය මොනතරම් වටිනා උතුම් පිංකමක් ද? ඒ සමගම විවිධ ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කර නොමිලේ බෙදාදීම ද හැම දෙනාගේම ඇගයීමට ලක් විය යුතුය.

නැති බැරි අහිංසක ජීවිත හඳුනාගෙන ඔවුන්ගේ දුක කඳුල වේදනාව නැතිකර ලීමට අවශ්‍ය දෑ පරිත්‍යාගය ද, පසුගිය කාලයේ අප රට තුළ ඇති වූ ස්වාභාවික ආපදා තත්වයෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් කරන ලද මූල්‍යමය දායකත්වය ද ප්‍රශංසනීයය.

අති පූජ්‍ය බෝදාගම චන්දිම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් කරනු ලබන මෙම අත්‍යුදාර සේවාව ඇගයීමක් ලෙස තායිලන්තයේ මහාවුලා ලොන් කෝන් විශ්ව විද්‍යාලයෙන් "සාහිත්‍ය ශූරී" ගෞරව නාමයක් පිරිනැමීම පිළිබඳ අපගේ බලවත් සතුට ද ප්‍රකාශ කරමි.

මානෙල්වත්ත, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයේ නිර්මාතෘ එහි උපකුලපති බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේට තවත් බොහෝ කාලයක් ශාසනික, අධ්‍යාපනික, සමාජයීය කාර්යයන් තව තවත් ශක්තිමත්ව, ප්‍රභාස්වරව ඉටු කිරීම සඳහා නිරෝගී සුවය හා ධෛර්ය ලැබේවායි ආශිංසනය කරමි.

මෙයට
ශාසනහිතකාමී,

අධ්‍යාපනපති අතිපූජ්‍ය කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති
උත්තරීතර මහානායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ
ශ්‍රී ලංකා අමරපුර මහා නිකාය

"අපදාන සොභිනි පඤ්ඤා"

මීරිගම - මිණිඔලුව විද්‍යාවාස මහ පිරිවෙන් විහාරාධිපති, ශාසන සෝභන,
සිරි සරණංකරෝපසේන වංසාලකාර, සාහිත්‍ය කීර්ති ශ්‍රී පරියත්තිධර, ධර්ම කීර්ති ශ්‍රී සරණංකර,
ත්‍රිපිටක විශාරද, ශාස්ත්‍රපති, අග්ගමහා පණ්ඩිත.

**අතිපූජ්‍ය මකුලෑවේ විමල ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක මහා ස්ථවිර**

**MOST. VEN. MAKULEWE WIMALA SRI LANKA RAMANNA MAHA NIKAYA MAHANAYAKA MAHA THERO**

**Vidyawasa Maha Pirivena ,**
**Minioluwa ,**
**Meerigama, Sri Lanka.**
**Tel: 0332273898 Fax 0332273898**
**Mobile 0716061632/ 0779983687**
**Email: widuwasoffice@gmail.com**

විද්‍යාවාස මහ පිරිවෙන,
මිණිඔලුව, මීරිගම.

ශ්‍රී බුද්ධ වර්ෂ 256......................
ව්‍ය.වර්ෂ 20......................

2026-01-18

**<u>ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේගේ ආශිර්වාද පණිවිඩය.</u>**

තායිවානයේ ප්‍රධාන සංඝනායක, මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයේ නිර්මාතෘ හා එහි උපකුලපති, ආචාර්ය පූජ්‍යපාද බෝදාගම චන්දිම නායක ස්ථවිරයන් වහන්සේගේ 69 වෙනි ජන්ම දිනය නිමිති කරගෙන පවත්වනු ලබන උපහාර උත්සවය වෙනුවෙන් එළිදක්වන ශාස්ත්‍රීය සංග්‍රහයට සුභාශිංසන පණිවිඩයක් නිකුත් කරන්නේ බලවත් සන්තෝෂයෙනි.

අප හිතවත් බෝදාගම චන්දිම නායක ස්ථවිරයන් වහන්සේ සේවයටම කැපවූ ජීවිතයක් ගත කරණ ත්‍රෛනිකායික මහා සංඝ රත්නයේ සම්භාවනාට පාත්‍ර වූ කල්‍යාණමිත්‍ර සත්පුරුෂ සංඝ නේතෘන් වහන්සේ නමකි. බෞද්ධ අධ්‍යාපනය ලෝකයට විවරකරමින් මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාල නිර්මාණය කළා සේම ලංකාව පුරා විවධ ප්‍රදේශවල පිරිවෙන් හා පාසල්වල යටිතලපහසුකම් වැඩිදියුණු කිරිමටත් පාසල් උපකරණ පරිත්‍යාග කිරිමෙන් දැයේ දූ දරුවන් වෙනුවෙන් කල සේවය සදා අනුස්මරණීයව පවතිනු ඇත. එසේම දහම් පාසල් පොත්, මහා පිරිත් පොත ආදි විශාල දහම් පොත් පත් ගණනාවක් මුද්‍රණය කරමින් නොමිලේ ලංකාව පුරා සියලු විහාරස්ථාන වෙනුවෙන් බෙදා දී තිබේ. එසේම ආර්ථික දුෂ්කරතා ඇති දරු දැරියන් සඳහා කරණ සේවය රටක ජීවනාලිය බඳු දරු පරපුර නැණ ගුණයෙන් පෝෂණය කිරීමට කරණ උදාර පරිත්‍යාගයේ වටිනාකම මෙතෙකැයි කිව නොහැකිය.

රට දැය බස හා ආගම දහම වෙනුවෙන් ඇප කැප වි "**චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය අත්ථාය හිතාය සුඛාය දේවමනුස්සානං**" යන බුද්ධානුශාසනය අනුව නිස්සරණධ්‍යාශයෙන් ක්‍රියා කරන, දෙස්-විදෙස් කීර්ති නාමයක් හිමිකරගෙන රටට ලෝකයට අමිල සේවයක් සිදු කරණ ආචාර්ය පූජ්‍යපාද බෝදාගම චන්දිම නායක ස්ථවිරයන් වහන්සේට හැට නවවන විය සම්පූර්ණ වන මේ අවස්ථාවේ ආගමික ශාසනික හා අධ්‍යාපනික සේවාවන් තව දුරටත් ඉතා මැනවින් ඉටු කරගෙන යෑමට තෙරුවන්ගේ අනන්ත ගුණ බලයෙන් හා සියලු දෙවි රැකවරණින් නිදුක් නීරෝගි චිරජිවනය සැළසේවායි අප ඉත සිතින් ආශිර්වාද කරමු.

**සුඛී දීඝායුකො භව..!**

මෙයට, ශාසනහිතකාමී,

අග්ගමහා පණ්ඩිත දර්ශන විශාරද අතිපූජ්‍ය මකුලෑවේ ශ්‍රී විමල අභිධාන
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක මහා ස්ථවිර.

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ
මහානායක ධූරන්ධර
අග්ග මහා පණ්ඩිත, පරියත්තිධර
ත්‍රිපිටක විශාරද - ශාස්ත්‍රපති
මකුලෑවේ විමල මහා ස්ථවිර
ශ්‍රී විද්‍යාවාස මහ පිරිවෙන
මිණිඔලුව - මීරිගම.

# සංස්කාරක සටහන

රෝද හතරක වාහනය රෝද දෙක තුනක වාහනයකට වඩා වේගයෙන් ගමනාන්තය කරා ගමන් කරවිය හැකිය. ආරක්ෂිත ය. සුව පහසු ය. එසේ ම බුද්ධසාසනය නැමැති රථයේ රෝද හතර වන්නේ සිව්වනක් පිරිස ය. මේ සතර දෙනා ම එකතු වූ විට සාසනික අරමුණ කරා පියමැනීම පහසු ය. සුරක්ෂිත ය. ප්‍රවේග කාරී ය. එබැවින් සිව්වනක් පිරිස ම උගත් වියත් වැදගත් සුපසන් පිරිසක් ව ගොඩ නැගීම උදෙසා සාහිත්‍යසූරී ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන් සිදුකර ඇත්තේ වචනවලින් විවරණය කළ නො හැකි බලගතු සම්ප්‍රදානයකි.

විටින් විට සාසනික දියුණුව උදෙසා දෙව්ලොවින් මනුලොවට බට යුගපුරුෂයන් සාසනික ඉතිහාසයේ අප අසා තිබේ. ජාතික, අධ්‍යාපනික, සාමාජික, සංස්කෘතික හා සාසනික වශයෙන් බලගතු පෙරළියකට කටයුතු කරන බෝදාගම චන්දිම නායක හාමුදුරුවෝ එලෙස මේ මනුෂ්‍ය ලෝකයේ පහළ වූවෙක් දැ යි සැක සිතේ.

මුලු ජීවිතය ම පරෝපකාරය උදෙසා කැප කළ බෝදාගම චන්දිම නාහිමියන්ගේ 69 වන ජන්ම දිනය දා දෙවන වරටත් මෙම ධර්ම ශාස්ත්‍ර වීමංසා ශාස්ත්‍රීය ලේඛන සමුච්චය සංස්කරණය කරන්නේ උන්වහන්සේට පිදෙන පූජෝපහාරයක් ලෙස ය. සංස්කාරකවරුන් ලෙස මෙම කෘතිය බෝදාගම චන්දිම නාහිමියන් වෙනුවෙන් උන්වහන්සේ වෙත වනපස මලක් කොට පුදමු.

ශාස්ත්‍රීය සමාජයට මෙම ලිපි සමුච්චයෙන් යම්කිසි දැනුමක් අවබෝධයක් ලබාගැනීමට හැකියාව ඇතැයි අපි විශ්වාස කරමු. මෙම ශාස්ත්‍රීය වෑයම සාර්ථකත්වයට පත්කිරීමෙහිලා දායකත්වය දුන්නෝ බොහෝ ය. පළමුව සුභාසංසන ලබා දුන් අස්ගිරි, අමරපුර හා රාමඤ්ඤ නිකායික මහනාහිමිවරු ගෞරව පෙරටුව සිහිකරමු. සංස්කාරකවරුන් ලෙස මෙම කටයුත්ත සංවිධානය කිරීමේ දී අප වෙත නිරන්තර උපදේශකත්වය ලබා දුන් ආචාර්ය දම්පේ විජිතරතන හාමුදුරුවෝ, ආචාර්ය හේනේගම ධම්මරතන හාමුදුරුවෝ, මහාචාර්ය අසංග තිලකරත්න මැතිතුමන්, මහාචාර්ය පී. බී. මණ්ඩාවල මැතිතුමන් හා ආචාර්ය සජීව පේමසිංහ මැතිතුමන් ගෞරවයෙන් සිහිපත් කරන්නෙමු.

මෙම ශාස්ත්‍රීය ප්‍රදානය සඳහා බෝදාගම චන්දිමාභිධාන අෂ්ඨකය රචනා කළ මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමියන් ප්‍රමුඛ ශාස්ත්‍රීය ලිපි ලේඛන ලබා දුන් නිර්ලෝභී ශාස්ත්‍රවන්තයන්ට කෘතඥ වෙමු. තවද, මෙහි ශාස්ත්‍රීය ලේඛනයන්හි සෝදුපත් පරීක්ෂා කළ නාගානන්ද ජාත්‍යතර බෞද්ධ අධ්‍යයන ආයතනයෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලයට ද, මනා කංචුකයක් නිම කරදුන් බුද්ධි රංගන මහතාව ද ගෞරවයෙන් සිහිපත් කරමු. හදිසියේ නමුත් පිටු සැකැස්ම මනාව නිමා කළ සඳිනි රසාංජලීට ද

මුද්‍රණ කටයුතු සාර්ථකව නිම කරමින් කටයුතු කළ රාජගිරිය කේ. එස්. යූ. මුද්‍රණාලයේ අධිපතිතුමන්ට සහ කාර්යමණ්ඩලයට අපගේ පුණ්‍යානුමෝදනාව පුදකරමු. මෙම ධර්ම ශාස්ත්‍ර විමංසා නැමැති ආචාර්ය බෝදාගම චන්දිම නාහිමි අභිස්තුති ශාස්ත්‍රීය ලේඛන සමුච්චය ධර්ම ශාස්ත්‍රකාමී හැමට කිසියම් හෝ සේවාවක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමු. කිසියම් හෝ දෝෂයක් වී නම් එය අප වෙත ම පමණක් යොමු කිරීමට කාරුණික වන්නේ නම් බෙහෙවින් කෘතඥ වෙමු.

මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයක් ලෙස එළිදකින මෙය ශාස්ත්‍රීය අධ්‍යයනය සඳහා වැදගත් ලේඛනයක් ව උපස්ථම්භක වේවායි ප්‍රාර්ථනා කරමු.

**සංස්කාරකවරු**
2026.02.03 දින

# බෝදාගම චන්දිම නායක ස්වාමීන්ද්‍ර අෂ්ටකය

## මැදගම්පිටියේ විජිතධම්ම

'**බෝදාගම චන්දිම නායකත්ථෙර අට්ඨකං**' යන නමින් පහතින් පළවන පාලි භාෂාමය අෂ්ටකය ශ්‍රී ලංකාද්වීපයෙහි නාමය ජාත්‍යන්තර තලයෙහි බබළවන්නට ශතවර්ෂ භාගයක් තරම් වූ කාලය මුළුල්ලෙහි අපමණ සේවයක් ඉටුකරමින් වැඩසිටින, එමෙන්ම පාලි ත්‍රිපිටකය හා වෙනත් බෞද්ධ ග්‍රන්ථ ව්‍යාප්ත කරලීමෙහි ලා අද්විතීය සේවයක් ඉටුකරන, තායිවානයේ ප්‍රධාන සංඝනායක ධුරන්ධර නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයෙහි නිර්මාතෘ හා වත්මන් උපකුලපති ආචාර්ය බෝදාගම චන්දිම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට ආශීර්වාද කරමින් රචනා කරන ලද්දකි.

අෂ්ටකයක් යනු කමනීය වෘත්තයකින් බඳනා ලද පද්‍ය අටක එකතුවකි. බොහෝ විට පද්‍යයේ අවසාන පාදය හෝ අවසාන පාද දෙක ම හෝ එක හා සමාන වාග්මාලාවකින් සැරසීමට අෂ්ටක පැරණි රචකයෝ යොමුවූහ.

අෂ්ටකයන්ගේ ආරම්භය ඍග්වේදයෙන් දැකගත හැකි බව විද්වතුන්ගේ අදහස යි. වාල්මීකීන් විසින් ගංගා නදියට පසසමින් රචිත ගංගාෂ්ටකය පැරණිතම සංස්කෘත අෂ්ටකය සේ සම්භාවිත ය. ආරම්භක කාලයේ සිට ම පාලි සාහිත්‍යය තුළ ද අෂ්ටක බිහි වී ඇත. සුත්තනිපාතයේ අට්ඨකවග්ගයේ ඇති පද්‍ය අටකින් පරිමිත සූත්‍ර මෙවැනි නිර්මාණ විය හැකි වුවත් ඒ පිළිබඳ නිශ්චිත නිගමනයක් මෙතෙක් ඉදිරිපත් ව නැත.

පාලි සාහිත්‍යයේ ඇති පැරණිතම අෂ්ටකය 'බාහුං සහස්සමභිනිම්මිත සායුධන්තං' ආදි වශයෙන් ඇරඹෙන ජයමංගල අෂ්ටකය යි. එය කෝට්ටේ යුගයේ දී රචිත බව සාමාන්‍ය පිළිගැනීම යි. වැලිවිට සිරි සරණංකර සංඝරාජයන් වහන්සේ විසින් ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ (ක්‍රි.ව. 1706-1736) රජු වෙනුවෙන් ලියන ලද සීහළින්ද අෂ්ටකයෙන් පසු මහනුවර යුගයේ දී උන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍යයින් විසින් පෝෂණය කරන ලද පාලි අෂ්ටක සාහිත්‍යයක් අප සතු වේ. එහි ව්‍යාප්තිය දහනව වන සියවස දක්වා ම පැතිර ගොස් විසිවන සියවසේ පළමු අර්ධය තුළ ත් දැකගත හැකිවිය. එකල ගිහි පැවිදි ප්‍රභූන් වෙනුවෙන් ලියැවුණු පාලි අෂ්ටක රාශියකි. එපමණක් නොව එකල මෙරට සේවය කළ කීර්තිමත් විදේශකයින් වෙනුවෙන් පවා ලියැවුණු අෂ්ටක අද ද විද්‍යමාන වේ. විසිවන සියවසේ අගභාගයෙන් පසු පාලි අෂ්ටක සාහිත්‍යය අභාවයට පත්වන්නට විය. මෙම අෂ්ටකය එම සාහිත්‍යයේ ජීවමානත්වය සඳහා ද හේතු වනු ඇත.

මෙම අෂ්ටකය එක් ගාථා පාදයකට තගණ (∪ ∪ –), භගණ (∪ – –), ජගණ (– ∪ –), ජගණ (– ∪ –), ගුරු (∪), ගුරු (∪) වශයෙන් ගුරු-ලඝු පිහිටන අක්ෂර දාහතරකින් යුත් සක්කරී (ශර්කරී) ඡන්දස් ප්‍රස්තාරයෙහි 2932 වන ස්ථානයෙහි යෙදෙන වසන්තතිලකා වෘත්තයෙන් බන්ධනය කරන ලදි. (පද්‍යවල වෘත්ත ස්ථානය සොයා ගැනීමට වුත්තොදයෙහි එන උද්දිෂ්ටප්‍රත්‍ය න්‍යාය අනුගමනය කළ හැකිය. එහි ලා පළමුව අදාළ ගාථා පාදයේ ගුරු ලඝු පිහිටීම ලියාගත යුතුය. පසුව එහි මුල්ම අකුරේ පටන් එක, දෙක ආදි වශයෙන් දෙකින් දෙකින් වැඩිකරගත් සංඛ්‍යා තැබිය යුතුය. ඊළඟට ලඝු අකුරු යට ඇති සංඛ්‍යා එකතු කළ යුතුය. එම ඓක්‍යයට එකක් එකතු කළ විට ඡන්දසෙහි වෘත්තය පිහිටන තැන ලැබෙයි.)

තව ද මහනුවර යුගයෙන් පසු කෙටි පාලි ගාථා බන්ධනයන්හි යෙදුණු පැරණි පාලි පද රචකයන්ගේ මග යමින් සෑම ගාථාවක ම අපරාර්ධය එනම් තෙවන හා සිව්වන ගාථාපාද සඳහා සමාන පදමාලාවක් භාවිත කිරීමට මෙහි ලා උත්සාහ කළ බව ද සඳහන් කරනු කැමැත්තෙමි.

## බෝදාගම චන්දිම නායකත්ථෙර අට්ඨකං

1. සංරක්ඛිතුං භගවතො ධම්මඤ්ච විනයං
   රත්තින්දිවං විවිධකම්මගණෙ කරොන්තො
   නාගාදිනන්ද විදිතායතනෙ අධීසො
   සො චන්දිමො යතිවරො සුචිරං විභාතු

2. බුද්ධස්ස ධම්මවිනයෙ පටිබද්ධචිත්තො
   සංඝස්ස කිච්චකරණෙ අකුසීතචරණො
   නාගාදිනන්ද විදිතායතනෙ අධීසො
   සො චන්දිමො යතිවරො සුචිරං විභාතු

3. සංවඩ්ඪනාදිවිසයෙ පටුබුද්ධිභාවං
   යස්සාපදානවිසයෙ සතතං තනොති
   නාගාදිනන්ද විදිතායතනෙ අධීසො
   සො චන්දිමො යතිවරො සුචිරං විභාතු

4. සාමීචිකම්මපමුඛො සිරිලීගුණග්ගො
   නෙකෙසු කිච්චකිරියෙසු සුසාධුරූපො
   නාගාදිනන්ද විදිතායතනෙ අධීසො
   සො චන්දිමො යතිවරො සුචිරං විභාතු

5. දුද්දිට්ඨි ආගුකලලං පරිසොධනත්ථං
නෙකානි ගන්ථරතනානි සදා දදන්තො
නාගාදිනන්ද විදිතායතනෙ අධීසො
සො චන්දිමො යතිවරො සුචිරං විභාතු

6. වෙසාරදො චජනකම්මවිධීසු නිච්චං
ඛන්තීගුණො සුගතසාසන වුද්ධිකාමො
නාගාදිනන්ද විදිතායතනෙ අධීසො
සො චන්දිමො යතිවරො සුචිරං විභාතු

7. ආරද්ධකිච්චවිසයෙ ඵලමෙවදස්සී
සබ්බං විධිං සුවිසදං සුසීසං කරොන්තො
නාගාදිනන්ද විදිතායතනෙ අධීසො
සො චන්දිමො යතිවරො සුචිරං විභාතු

8. ලංකාය දීපපවරෙ යසසා ජලන්තො
සම්භාවිතො සකලසංසජනෙහි සම්මා
නාගාදිනන්ද විදිතායතනෙ අධීසො
සො චන්දිමො යතිවරො සුචිරං විභාතු

**කත්තුසන්දස්සනං**

'බෝදාගම' නාම ගාමෙ - චන්දිම අභිධානස්ස
නායකමහාත්ථෙරස්ස - නෙකගුණෙ සරිත්වාන

විජිතධම්මනාමෙන - භික්ඛුනා හිතකාමෙන
පාලියා රචිතං එතං - අට්ඨකං පරිනිට්ඨිතං

## බෝදාගම චන්දිම නායක ස්වාමීන්ද්‍ර අෂ්ටකය

1. භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය හා විනය ආරක්ෂා කරන්නට රෑ දාවල් විධිධ වූ කටයුතු රැසක් කරන්නා වූ නාගානන්ද බෞද්ධ අධ්‍යයන ආයතනයේ අධිපති ධූරීණ ඒ චන්දිම යතීන්ද්‍රයන් වහන්සේ බොහෝ කාලයක් බැබළේවා.

2. බුදුරජාණන් වහන්සේගේ ධර්මවිනයෙහි බැඳුණු සිත් ඇති සංඝයාගේ කටයුතු කිරීමෙහි කුසීත නොවූ හැසිරීම් ඇති නාගානන්ද බෞද්ධ අධ්‍යයන ආයතනයේ අධිපති ධූරීණ ඒ චන්දිම යතීන්ද්‍රයන් වහන්සේ බොහෝ කාලයක් බැබළේවා.

3. සංවර්ධනය කිරීම් ආදිය විෂයයෙහි තීක්ෂණ බුද්ධියක් යම් කෙනෙකුන්ගේ චරිතය විෂයයෙහි නිරන්තරයෙන් පැතිරේ ද නාගානන්ද බෞද්ධ අධ්‍යයන ආයතනයේ අධිපති ධුරීණ ඒ චන්දිම යතීන්ද්‍රයන් වහන්සේ බොහෝ කාලයක් බැබළේවා.

4. සාමීචි කර්මය ප්‍රමුඛ මෘදුගුණවලින් අග්‍ර වූ නොයෙක් කටයුතු කෙරෙහි වූ මනා ගති ඇති නාගානන්ද බෞද්ධ අධ්‍යයන ආයතනයේ අධිපති ධුරීණ ඒ චන්දිම යතීන්ද්‍රයන් වහන්සේ බොහෝ කාලයක් බැබළේවා.

5. මිථ්‍යාදෘෂ්ටි පාපය නමැති මඩ පිරිසිදු කිරීම පිණිස නොයෙක් ග්‍රන්ථරත්නයන් සැමදා බෙදා දෙන්නා වූ නාගානන්ද බෞද්ධ අධ්‍යයන ආයතනයේ අධිපති ධුරීණ ඒ චන්දිම යතීන්ද්‍රයන් වහන්සේ බොහෝ කාලයක් බැබළේවා.

6. පරිත්‍යාග කටයුතුවල නිරන්තරයෙන් විශාරද වන්නා වූ ඉවසීම් ගුණයෙන් යුක්ත වූ බුද්ධශාසනය නංවාලීමෙහි කැමැත්තක් ඇත්තා වූ නාගානන්ද බෞද්ධ අධ්‍යයන ආයතනයේ අධිපති ධුරීණ ඒ චන්දිම යතීන්ද්‍රයන් වහන්සේ බොහෝ කාලයක් බැබළේවා.

7. ආරම්භ කරන ලද කටයුතුවල ප්‍රතිඵලයම දකිමින් සියලු කටයුතු සුවිශදව ඉතා ඉක්මනින් කරන්නාවූ නාගානන්ද බෞද්ධ අධ්‍යයන ආයතනයේ අධිපති ධුරීණ ඒ චන්දිම යතීන්ද්‍රයන් වහන්සේ බොහෝ කාලයක් බැබළේවා.

8. උතුම් දිවයිනක් වන ලංකාවෙහි යසසින් දිදුලන සියලු සංඝයා විසින් මනාව සම්භාවනා කරන ලද නාගානන්ද බෞද්ධ අධ්‍යයන ආයතනයේ අධිපති ධුරීණ ඒ චන්දිම යතීන්ද්‍රයන් වහන්සේ බොහෝ කාලයක් බැබළේවා.

**කර්තෘ සන්දර්ශනය**

බෝදාගම චන්දිම නම් නායක මහතෙරපාණන්ගේ විවිධ ගුණ සිහි කොට උන්වහන්සේට හිත කැමැත්තා වූ මැදගම්පිටියේ විජිතධම්ම භික්ෂුව විසින් පාලි භාෂාවෙන් රචනා කරන ලද මෙම අෂ්ටකය නිමා විය.

# ලේඛක නාමාවලිය

1. **මැදගම්පිටියේ විජිතධම්ම හිමි**
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පාලි භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

2. **Ven. Walmoruwe Piyaratana**
Assoc. Prof., Chairman, BA English Program, Faculty of Buddhism
Mahachulalongkornrajavidyalaya University, Wang Noi Ayutthaya, Thailand.
piyaratana.wal@mcu.ac.th

3. **ඩෙන්සිල් සේනාධීර**
විද්‍යාත්මක සහකාර, පශ්චාත් අධ්‍යයන පීඨය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය.
PhD in Buddhist Studies (Kelaniya), M.Phil. in Buddhist Studies (Kelaniya), M.A. in Buddhist Studies (Kelaniya), B.A. (J'pura)
senadheeradenzil@gmail.com

4. **ඒ.ඒ. ෂම්මි ඉෂාරා අමරකෝන්**
තාවකාලික කථිකාචාර්ය, දර්ශනය අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.
B.A (Hons) in Philosophy (Kelaniya)
shammi.ishara3232@gmail.com

5. **පනාමුරේ චන්දිම හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බෞද්ධ හා පාලි අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.
B. A in Buddhist Philosophy, Royal Pandit (OSS), M A in Buddhist Studies, PhD in Buddhist Philosophy, Diploma in Japanese Language, Diploma in Public Low
pchandima@busl.ac.lk

6. **සංජීවනී රූපසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශනය අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
PhD candidate (University of Hull, England), MPhil, BA (Peradeniya)

7. **තුසිත රාජපක්ෂ**
සහකාර කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණු විශ්වවිද්‍යාලය
PhD (J'pura), M.A. (Kelaniya) B.A (Hons) (Peradeniya)
nthusithacr@gmail.com

8. **ඩබ්ලිව්. එම්. එච්. සී. විජේතුංග**
B. A. (Hons) (J'pura), PGDE (NIE)
hirunichamika1989@gmail.com

9. **ආර්. ඩී. එස්. මධුෂිකා ගුණවර්ධන**
Student, Faculty of Buddhist Studies, (NĀGĀNANDA)
sajanimadushika360@gmail.com

10. **කේ. ඩබ්ලිව්. දුලිත් නුජිත**
B. A. in (Hons) Buddhist Philosophy (Followong), (Ruhuna)
nujithadulith@gmail.com

11. **ආර්. පී. සී. එච්. පෙරේරා**
PhD candidate (Liaoning University, China), MPhil, BA (Peradeniya)
chammm2233@gmail.com

12. **එම්. එම්. වයි. විජේතුංග**
M. A (Reading), B. A (Peradeniya)

13. **පූජ්‍ය පැලවත්තේ රතනසිරි හිමි**
ආධුනික කථිකාචාර්ය, නාගානන්ද ජාත්‍යයන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය.
Mphil (Reading - PGIPBS Kelaniya) M.A (Reading - PGIPBS Kelaniya) B.A (hons) in Pali (Ruhuna) Prachina Pandit (OSS)
8346262@gmail.com

14. **ඩබ්. ඒ. කේ. චතුරි**
පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
PhD (Reading) (BPU), M.A. (BPU), B.A. (BPU), PGDE (UOC)
chathuriwak@gmail.com

15. **වයි. කේ උදය බණ්ඩාර යටිවැල්ල**
පරිවේණාචාර්ය (සංගීත), සිරි සුමංගල පිරිවෙන් විද්‍යායතනය, වලලියද්ද, එල්ලක්කල
PhD (UVPA), M.P.A (UVPA), B.P.A (UVPA), PGDE (NIE), FA..Dip (NYSC), Visharad (BSVL)
udayabandarayati@gmail.com

16. **හොරගල විමලතිස්ස හිමි**
සහකාර කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
vimalathissa@sinh.cmb.ac.lk

17. **Ven. Girandurukotte Sasanarathana**
Lecturer (Probationary) Department of Buddhist and Pali Studies, Bhiksu University of Sri Lanka Anuradhapura
M.Phil. (Reading) (Kelaniya), M.A. in Buddhist Studies (PGIPBS, Kelaniya), M.A. in Buddhist Counselling (PGIPBS, Kelaniya), B.A. in Buddhist Philosophy (BUSL)
sasanarathana@busl.ac.lk

18. **Ven. Alapaladeniye Gunarathana**
M.Phil. (Reading) (PGIHS, Peradeniya)
grathana311@gmail.com

19. **Kameshi W.M.**
Student, Department of Buddhist Studies, Faculty of Buddhist Studies, (NĀGĀNANDA)
manudulakameshivoice@gmail.com

20. **Ven. Siyambalawewa Yaye Dhammasarini**
Student, Department of Buddhist Studies, Faculty of Buddhist Studies, (NĀGĀNANDA)
dhammasarini@gmail.com

21. **H. J. R. Buddhika**
Senior Lecturer, Department of Finance, Faculty of Commerce & Management Studies University of Kelaniya
buddhikar@kln.ac.lk / buddhika925@gmail.com

22. **Ven. Bingiriye Sunandabodhi**
M.A. in Buddhist Studies, (BPU), BBA (Colombo)
sunandaboodhi@gmail.com

23. **Ven. R. Dhammasiri**
Assistant Lecturer, Department of Buddhist and Pali Studies, Bhikshu University of Sri Lanka.
B.A. (Hons) in Buddhist Philosophy, (Ruhuna).
dhammasirihimikottawa@gmail.com

24. **R.M. Suneth Bandara**
Lecturer, Department of Pali and Buddhist Studies, Nāgānanda International Institute for Buddhist Studies (NIIBS) Manelwatta, Kelaniya, Sri Lanka
sunethbandara91@gmail.com

25. **Rev. Unapane Pemananda Thero**
Guest Researcher, University of Oslo
PhD in Buddhist Studies (Hong Kong), M.Phil. in Religion and Diversity (Norway), M.Phil. in Buddhist Studies (Peradeniya), MSc. Human Rights and Multiculturalism (Norway), Dip. In Cognitive Science, (Italy), B.A in Buddhist Studies (Peradeniya)

26. **E. W. A. Hasini Sandeepani**
BA (Hons) in Buddhist Studies, University of Colombo
hasiniethdathwaduge@gmail.com

27. **Iromi Ariyaratne**
Senior Lecturer, Department of Buddhist Culture, Postgraduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya
Ph.D in Buddhist Studies (Peradeniya), B. A. (Special), (Peradeniya), Dip. In Pali
iromiariyaratne@gmail.com

28. **Eshan Imalka Wijerathne**
Lecturer, Teachers College of Aesthetic Education, Giragama.
eshanpanhinda@gmail.com

29. **S. M. Irshad**
B. A (OUSL), Pgd. Archeology, MSc. Archelogy (PGIAR Kelaniya)
irshadmohamed652@gmail.com

30. **K. P. D. S. L. Kodagoda**
Lecturer, School of ICT, Nāgānanda International Institute for Buddhist Studies, Sri Lanka.
B. P. A (Hons) in Multimedia (UVPA), MISM (Colombo)
lasikakodagoda26@gmail.com

31. **Rifka farwin, M. T**
Former Assistant Lecturer, Department of Sociology, University of Ruhuna
rifkafarwin777@gmail.com

32. **Anoshan Yoganathan**
Student, Faculty of Technology, South Eastern University of Sri Lanka.
anoshan6@gmail.com

33. **N. Indhupriya**
Research scholar (full time), PG & Research Department of Commerce, Nallamuthu Gounder Mahalingam College, (Autonomous) Pollachi- 642 001 Tamil Nadu, India.
indhupriyan12@gmail.com

**G. Gnanaselvi**
Assistant Professor, PG & Research Department of Commerce, Nallamuthu Gounder Mahalingam College, (Autonomous) Pollachi- 642 001 Tamil Nadu, India.
gnanaselvi2@gmail.com

34. **A. M. Samadhi Bandara**
B.A (Hons) in Archaeology (Peradeniya)
samadhibandara934@gmail.com

35. **H. G. C. K. Hulangamuwa**
IT Lecturer, Faculty of Computing, CINEC Campus.
BSc IT (J'pura), MSc IT (Moratuwa)
chaamiusjp@gmail.com

# පටුන


- සියම් මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ මහානායක මාහිමිපාණන් වහන්සේගේ සුභාශංසන පණිවිඩය. vii
- ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක මාහිමිපාණන් වහන්සේගේ සුභාශංසන පණිවිඩය. ix
- ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක මාහිමිපාණන් වහන්සේගේ සුභාශංසන පණිවිඩය. xi
- සංස්කාරක සටහන xiii
- බෝදාගම චන්දිම නායක මහා ස්වාමීන්ද්‍ර අෂ්ටකය xv
- ලේඛක නාමාවලිය xix

**A Luminary of Compassion: The Journey of Ven. Dr. Bodagama Chandima Nayaka Thero** 01
Ven. Dr. Walmoruwe Piyaratana

## ශාස්ත්‍රීය ලේඛනාවලිය

1. සුඛමරණය සහ වෛද්‍ය ආචාරධර්මඃබුදුසමය ඇසුරෙන් විමර්ශනයක් 08
   ඩෙන්සිල් සේනාධීර

2. දින්නාගගේ හේතුචක්‍ර ක්‍රමය සහ ඇරිස්ටෝටල්ගේ සංවාක්‍යය ක්‍රමයෙහි තර්කයක විධිමත් වලංගුභාවය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්. 15
   ඒ.ඒ. ෂම්මි ඉෂාරා අමරකෝන්

3. බුද්ධකාලීන භික්ෂු හැසිරීම් වෙනස් වීම පිළිබඳ විමර්ශනයක් 32
   පනාමුරේ චන්දිම හිමි

4. බුදුන් මැරීම, දැනුම සහ නොදැනුම පිළිබඳ දර්ශනය 42
   සංජීවනී රූපසිංහ

5. පසේ බුදුවරුන්ගේ ආරාමික ජීවිතය පිළිබඳ සංක්ෂිප්ත විමසුමක් 59
   එන්. තුසිත රාජපක්ෂ

6. බ්‍රහ්මචරිය : බෞද්ධ අර්ථකථන පිළිබඳ විමසුමක් 74
ඩබ්ලිව්. එම්. එච්. සී. විජේතුංග

7. පාලි අට්ඨකථා සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනයක් 85
ආර්. ඩී. එස්. මධුෂිකා ගුණවර්ධන.

8. කාලාම සූත්‍රයෙහි ප්‍රකට වන ඥාන මාර්ග ඥාන සීමාවන් වන්නේ කෙසේද යන්න පිළිබඳ බෞද්ධ ආකල්පය : විමර්ශනාත්මක අධ්‍යයනයක් 103
කේ.ඩබ්ලිව්. දුලිත් නූජිත

9. මාහායාන දාර්ශනික සම්ප්‍රදාය තුළ නාගර්ජුන පාදයන්ගේ ශූන්‍යතාවාදී දර්ශනයෙහි සුවිශේෂීත්වය පිළිබඳ දාර්ශනික අධ්‍යනයක් 118
ආර්. පී. සී. එච්. පෙරේරා

10. මහාවස්තුව හා සද්ධර්මපුණ්ඩරික සූත්‍රයෙන් පිළිඹිබු වන බුද්ධ සංකල්පය 131
එම්. එම්. වයි. විජේතුංග

11. පාලි සාහිත්‍යයෙන් පිළිබිඹු වන රෝහණ රාජ්‍යයේ ඉතිහාසය 139
පූජ්‍ය පැලවත්තේ රතනසිරි හිමි

12. මහහීල්ල ශ්‍රී සුදර්ශනාරාමස්ථ පුස්කොළ ලේඛන එකතුවට අයත් සංස්කෘතික වටිනාකම් පිළිබඳ අධ්‍යයනයක් 154
ඩබ්. ඒ. කේ. චතුරි

13. පිරිවෙන් විද්‍යායතන අධ්‍යාපන ආයතනවල සංගීත අධ්‍යාපනයේ පසුබිම සහ පරිණාමය පිළිබඳ සාහිත්‍ය පාදක අධ්‍යයනයක් 172
වයි. කේ උදය බණ්ඩාර යටිවැල්ල

14. කේ. ජයතිලකගේ කෙටි ගද්‍ය නිර්මාණවල හමුවන ක්ෂුද්‍ර ප්‍රබන්ධමය ආකෘති පිළිබඳ අධ්‍යයනයක් 185
හොරගල විමලතිස්ස හිමි

15. සදාචාරාත්මක සාහිත්‍ය විචාරවාදය හා ජාතක පොත එම දෘෂ්ටි කෝණයෙන් විචාරය කිරීමේ ශක්‍යතාව 199
පූජ්‍ය පැලවත්තේ රතනසිරි හිමි

16. **An approach to ethical consideration of verbal communication in Buddhist Teachings** 210
Ven. Sasanarathana. G

17. **Proto-abhidhamma schematization in the suttas: an analysis of the saṅgīti sutta and dasuttara sutta** 225
Ven. Alapaladeniye Gunarathana

18. **Visualizing enlightenment: the Evolution, Function, and Cross-cultural impact of the Buddha Statue** 234
Kameshi W.M.

19. **The Early Buddhist understanding of dukkha: Its types and role in the four noble truths** 244
Ven. Siyambalawewa Yaye Dhammasarini

20. **Personality analysis in theravada Buddhism: special reference to Visuddhimagga, Sutta piṭaka & Abhidhamma Piṭaka** 255
H.J.R. Buddhika

21. **From monastic to management: Strategies for Sustaining Buddhist values in modern society** 279
Ven. Bingiriye Sunandabodhi

22. **An Investigative study of the Origin and Development of Sikhism** 292
Ven. R. Dhammasiri

23. **Therapeutic methods in Buddhist Narratives - Case studies of Healing and Transformation** 303
R.M Suneth Bandara

24. **How Interreligious Encounters produce New Forms of Ethical citizenship** 314
Rev. Unapane Pemananda Thero

25. **The Buddhist methodology for calming mental agitation: Based on the Sabbāsava Sutta and The Vitakkasaṇṭhāna Sutta** 324
E.W.A. Hasini Sandeepani

26. **A Brief Analysis of Pali tems denoting Women** 339
Iromi Ariyaratne

27. **Theravada Buddhism and Wealth in Sri Lanka** 367
Eshan Imalka Wijerathne

28. **Guardians of the four directions; 9th Century Bronze Statues from Anuradhapura at the Metropolitan Museum of Art** 377
S. M. Irshad

29. **Ai-Driven mindfulness: A conceptual framework for designing a smart meditation assistant based on Buddhist practices** 388
K.P.D.S.L. Kodagoda

30. **Community Engagement in post-rehabilitation reintegration: evidence-Based Insights from Sri Lanka** 397
Rifka farwin, M.T.

31. **Understanding the spread of Dhamma teachings through Social media algorithms: A Network-based Study** 419
Anoshan Yoganathan

32. **Cultural identity and fashion choices: Exploring generation z's preference and behaviour toward traditional dress** 429
Ms.N. Indhupriya and Dr. G.Gnanaselvi

33. **Pollen as evidence: Global archaeological insights from a Century of Palynological Research** 438
A.M. Samadhi Bandara

34. **Evaluating Web accessibility compliance of Government Websites in Sri Lanka** 459
H.G.C.K. Hulangamuwa